රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 30/94

මගේ අංකය :- I/543E/02D/02/94(1) නාව,
රාජ්‍ය පරිපාලන අමාතනාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
1994 අගෝස්තු මස 11 වන දින.

සියලුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

ලේකම්වරුන්ගේ, අතිරේක ලේකම්වරුන්ගේ සහ දිප ව්‍යාප්ත සේවාවල වැටුප් විෂමතා ඉවත් කිරිම.

ලේකම්වරුන්ගේ, අතිරේක ලේකම්වරුන්ගේ සහ දිප ව්‍යාප්ත සේවාවල වැටුප් 1994 අගෝස්තු මස සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කිරිමට රජය තීරණය කර ඇත.

02. (අ) අදාල කරගත යුතු නව වැටුප් පරිමාණයන් පහත දක්වනු ලැබේ.

| | |
|---|---|
| ලේකම්වරු | රු. 143,400 - 8 x 7,800 - 205,800 |
| අතිරේක ලේකම්වරු | රු. 135,600 - 8 x 7,800 - 198,000 |
| 1 වන පන්තිය | රු. 105,000 - 10 x 4,800 - 133,000 |
| II වන පන්තිය ශ්‍රේ.1 | රු. 80,400 - 7 x 3,000 - 101,400 |
| III වන පන්තිය ශ්‍රේ.II | රු. 53,880 - 15 x 1,560 - 77,280 |

(ආ) දිප ව්‍යාප්ත සේවාවන් නම්

(1) ශ්‍රී ලංකා පරිපාලන සේවය,
(2) ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය,
(3) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය,
(4) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය,
(5) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය,
(6) ශ්‍රී ලංකා සැලසුම් සේවය,
(7) ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය,
(8) ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය.

03. මෙම සේවාවන්වල නිලධාරින්ගේ වැටුප් වර්ධක දිනයන් නොවෙනස්ව පවතිනු ඇත.

04. මෙම සේවාවන්වල නිලධාරින්ගේ දැනට පවත්නා කාර්යක්ෂම කඩඉම් අදල වැටුප් පරිමාණයන්ගේ අනුරූපී වැටුප් පියවර වලදි ක්‍රියාත්මක වනු ඇත.

05. වැටුප් පරිවර්තනය කිරිම පියවරෙන් පියවරට තැබිමේ පදනම මත කරනු ලැබේ.

වයි.බී.පුස්සෙදෙනිය
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.